Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2016-06-07 |

පැමිණිලිකරු : එස්.ජ් ගුණවර්ධන මයා
නො 48/10 ස්වර්ණප්‍රදීප පෙදෙස.
බොරුල්ල පාර.
දෙපානම පන්නිපිටිය.

වගඋත්තරකරුවන් : 01 බ්‍රිගේඩියර් පී.ජ්.කේ තිලකරත්න මයා.
පීඨාධිපති.
උපාධි අධ්‍යයන පීඨය,
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය,
රත්මලාන

02. ලේඛකාධිකාරී.
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය,
රත්මලාන.

පැමිණිලි අංකය : **HRC/4326/15**

පැමිණිල්ල :-

පැමිණිලිකරු සිය පැමිණිල්ල කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් ඉදිරිපත් කොට ඇත්තේ. තමා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ නිතිය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවේ අවසන් විභගායට පෙනී සිටීමට නියමිත ශිෂ්‍යයෙකු බවත් මෙකී පාඨමාලාව වසර 2ක කාලයක් තුළ අධ්‍යයන වාර 4ක් තුලින් සැදුම්ලත් විෂයන් 11 කින් හා ඊට අදාළ පැවරුම් 11 කින්ද විෂය බාහිර පැවරුමකින්ද සැදුම්ලත් බවත්ය. මෙම පාඨමාලාව වසර 2ක් හැදෑරිමෙන් අවසානයේ අවසාන ලිඛිත පරික්ෂණයට පෙනි සිටීමට පැමිණිලිකරු අපේක්ෂාවෙන් සිටින බවත් නමුත් විශ්වවිද්‍යාලය විසින් ගන්නා ලද නිත්‍යානුකූල නොවන පරිපාලන තින්දුවක් හේතුවෙන් තමන්ට අවසාන



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165,කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පරික්ෂණයේ එක් විෂයකට එනම් අන්තර්ජාතික වෙළඳ නීතිය විෂයට පෙනී සිටීමට අවස්ථාව ලබා නොදීමට පරිපාලනය තීරණය කොට ඇති බවත්ය. එයට හේතු ලෙස එකී විෂයට අදාළ දේශන සඳහා තමන් ප්‍රමාණවත් සහභාගිවීමක් සිදු කොට නොමැති බවත් ඒ හේතුවෙන් අවසාන ලිඛිත පරික්ෂණයට මුහුණදීමට ඉඩ ලබාදිය නොහැකි බවත් දන්වා ඇති බවද සඳහන් කර ඇත. මෙම පාඨමාලාවට ඇතුළත් වන මූල් අවස්ථාවේ සිට වසර 2 කාලය අවසන් වන කාලය දක්වා දේශනයන්ට සහභාගිවීම අනිවාර්ය සාධකයක් ලෙස හෝ සහභාගිවීමේ ප්‍රතිශතය කොපමණ විය යුතු ද යන්න නිශ්චිතව පාඨමාලාවෙහි ශිෂ්‍යයින්ට හඳුන්වාදීමක් සිදු කොට නොමැති බවත් එවැනි පූර්ව දැනුම්දීමකින් හෝ නිති හඳුන්වාදීමකින් තොරව විභාගයට මුහුණ දෙන අවසාන මොහොතේ පරිපාලන තීන්දු ගැනීම මගින් තමන්ට විභාගයට මුහුණදීමට අවහිර කිරීම පැහැදිලිවම වෙනස් කොට සැලකීමක් බවත් එය නීතිය සර්ව සාධාරණව ක්‍රියාත්මක නොකරන අවස්ථාවක ලෙසත් කොමිෂන් සභාව හමුවේ පැමිණිලි කොට ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

සිය ලිඛිත හා වාචික දේශන කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් වගඋත්තරකරුවන් පහත කරුණු දක්වා ඇත. එනම්,

නීතිය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව වසර 2ක් පුරා ක්‍රියාත්මක වන පාඨමාලාවක් වන බවත් පැමිණිලිකරු ලියාපදිංචි වී ඇති පාඨමාලාව 2013.09.01 වන දින ආරම්භ කොට ඇති බවත් දක්වා ඇත. පාඨමාලාවට අදාළ සමාරම්භක උත්සවයේදී පාඨමාලාව පවත්වා ගෙන යන ආකාරය පිළිබඳ සම්පූර්ණ කරුණු දැක්වීමක් සිදු කළ බවත් එහිදී දේශනවලට සහභාගිවීම අනිවාර්ය සාධකයක් බවත් ලිඛිත විභාගයන් සඳහා පෙනී සිටීම සඳහා 50% ප්‍රතිශතයක් සියලුම ශිෂ්‍යයින් විසින් සපුරා තිබිය යුතු බවත් දන්වා ඇත. එසේම පාඨමාලාවට අදාළ අත්පොත්හි සියලු කරුණු ඇතුළත් කොට ඇති බවත් එකී අත් පොත සියලු ශිෂ්‍යයින්ට ලබා ගැනීමේ හැකියාව පවතින බවත් වැඩිදුරටත් දන්වා ඇත.

එසේම දේශනවලට සහභාගිවීම අත්‍යාවශ්‍ය කාරණයක් ලෙස විශ්වවිද්‍යාල අනුනීතින් හි සඳහන් වන බවත් එය සියලු ශිෂ්‍යයින් දැනුවත් කාරණයක් වන බවත් විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වන වෙනත් සියලුම පශ්චාත් උපාධි සඳහාද දේශනවලට සහභාගිවීම 50% අවශ්‍යතාවය සියලු ශිෂ්‍යයින් විසින් පූර්ණය කළයුතු කාරණයක් වන බවත් ලේඛන ගත සාක්ෂි ඉදිරිපත් කරමින් දන්වා ඇත. වෙනත් විශ්වවිද්‍යාලයන්හි පැමිණීමේ ප්‍රතිශතය 70% - 80% ක් පමණ ඉහළ ප්‍රතිශතයක් අපේක්ෂා කළද කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය තුළ පශ්චාත් උපාධි පාඨමාලව තුළ 50% ක ප්‍රතිශතයක් පමණක් සලකා බලන බවද දක්වා ඇත.

එගැත්තරකාර පාර්ශවය පැමිණිල්ලට අදාලව නිතිය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවට සම්බන්ධ සියලු විෂය නිර්දේශයන් දේශන පැවැත්වීමේ කාල පරිච්ඡේදයන් පිළිබඳ සටහන් විශ්ව විද්‍යාල අනු නිතින් අධ්‍යක්ෂ මණ්ඩල තිරණයන් පැමිණිලිකරුගේ දේශනවලට සහභාගිවීමට අදාළ විස්තර ඇතුළත් ලේඛන හා විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වන වෙනත් පශ්චාත් උපාධි පාඨමාලවන්ට අදාළ ලේඛන ආදි වූ ලිඛිත සාක්ෂි කොමිෂන් සභාවට සපයා ඇත.

**කොමිෂන් සභාව හමුවේ අනාවරණය වි ඇති කරුණු :-**

පැමිණිල්ල මගින් මතුකොට ඇති මූලික කාරණාව වන්නේ විශ්වවිද්‍යාලයේ අනු නිතින් හා රිතින් හී දේශනවලට සහභාගිවීම අනිවාර්ය නිතියක් ලෙස සඳහන් කොට නොමැති බවත් විශ්වවිද්‍යාලයේ අනු නිති පිළිබඳ අවුරුදු 2ක කාලය තුළ ශිෂ්‍යයින් කිසිදු අවස්ථාවක ලිඛිත හෝ වාචික  දැනුවත් කොට නොමැති බවත්.

නිතිය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවේ පළමු, දෙවන සහ තෙවන අධියර යටතේ පැවති පූර්ව විභාග 3 සඳහාම පැමිණිමේ ප්‍රතිශතයක් අපේක්ෂා නොකළ බව හා ප්‍රතිශතය ශූන්‍ය අපේක්ෂකයින්ද පවා ඉහත විභාගයන්ට පෙනී සිටි ප්‍රතිඵල ලබා ඇති බවත්,

විවිධ විෂයන් සඳහා භාරදිය යුතු පැවරුම් නියමිත දිනයට භාරදිය යුතු වුවත් ඇතැම් සිසුන් බොහෝ කල්ගතවී එම පැවරුම් භාරදී ඇති බවත් ඔවුන්ට නියමිත ලකුණු ලබාදී ඇති බවත්,

වසර 2ක් අවසාන වනතුරු පැමිණිලිකරු ඇතුලු සිසුන්ට ශිෂ්‍ය හැඳුනුම්පත ලබාදී නොමැති බවත් පුස්ථකාල පහසුකම් සඳහා වන පුස්ථකාල ප්‍රවේශ පත්‍රය පාඨමාලාව අවසන්වනතුරු ලබාදී නොමැති බවත් පුස්තකාල පරිශීලනය කිරිමට කිසිදු අවස්ථාවක් ලබාදී නොමැති බවත්.

දේශන ඉතා අවිධිමත් අයුරින් පැවැත්වූ බවත් ක්ෂණිකව දැනුම්දීම් මගින් නියමිත දේශන අහෝසි කරන බවත් විශ්වවිද්‍යාලය වෙත භාරදෙන විෂය පැවරුම් විශ්වවිද්‍යාල බලධාරින්ගේ නොසැලිකිලිමත්කම හේතුවෙන් අස්ථානගතව එම හේතුවෙන් නැවත පැවරුම් සිසුන්ට භාරදීමට සිදුවී ඇති බවත්.

ආදි වූ කරුණු ඉදිරිපත් කරමින් පැමිණිලිකරු ප්‍රශ්නගත පාඨමාලාව තුළ පවතින අවධිමත් ක්‍රියාකලාපයන් තහවුරු කිරිමට උත්සාහ දරා ඇති බව අනාවරණය වී ඇත..

නමුත් අවසාන අධියරයේ අවසාන ලිඛිත පරීක්ෂණයේදී පමණක් වගඋත්තරකරුවන් විසින් අනම්‍යශීලි තීරණයක් අනුගමනය කර ගනිමින් සම්පූර්ණ පාඨමාලා කාලය තුළම තමන් විසින් සිදු කොට ඇති සියලු නොසලකා හැරීම් අවිධිමත් ක්‍රියාවන් හා නිත්‍යානුකූල නොවන ක්‍රියාවන් නිවැරදි කිරීමට උත්සාහ දරා ඇති බවද අනාවරණය වී ඇත. මෙම ක්‍රියාවන් හේතුවෙන් ශිෂ්‍යයින්ට මුහුණදීමට ඇති අයහපත් ප්‍රතිඵලයන් කෙරෙහි අවධානය යොමු නොකරමින් හුදෙක් අත්තනෝමතික ආකාරයෙන් පවතින නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමට වගඋත්තරකරුවන් ක්‍රියා කොට ඇති බවද වැඩිදුරටත් කරුණු දක්වා ඇත.

ඉහත කරුණු සලකා බැලීමේදී කොමිෂන් සභාව හමුවේ පවත්වන ලද පරීක්ෂණය හා දෙපාර්ශවය විසින්ම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද ලිඛිත දේශන සලකා බැලීමේදී නවදුරටත් පහත කරුණු අනාවරණය වී ඇත. එනම්

<u>අනුනීතින් හා දේශන සඳහා පැමිණීමේ ප්‍රතිශතය</u>

පැමිණිල්ල මගින් ඉදිරිපත් කොට ඇති ප්‍රධාන කාරණාව වන්නේ කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව පවත්වාගෙන යාමේදී විශ්ව විද්‍යාල අනු නීතින්හි සඳහන් නෛතික ප්‍රතිපාදනයන් නිවැරදිව ක්‍රියාත්මක කොට නොමැති බව හා එකී අනු නීතින් හි දේශනයන්ට සහභාගිවීමේ ප්‍රතිශතය පිළිබඳව නෛතික ප්‍රතිපාදන ඇතුළත්ව නොමැති බවයි.

ආරක්ෂක විශ්වවිද්‍යාලය තුළ වසර 2ක පශ්චාත් උපාධි පාඨමාලාවෙහි පැමිණීම අත්‍යාවශ්‍ය කාරණයක් ලෙස අධියර 4කින් යුතු පාඨමාලාවේ අධියර 3ක් සඳහාම සලකා නොමැත. එනම් මුල් අධියර 3 සඳහාම නියමිත කාල සීමාව හෝ නියමිත දේශනවලට සහභාගීත්වය යන කාරණය ඉතාම නම්‍යශීලි ප්‍රතිපත්තියක සිට ක්‍රියාත්මක කර ඇත. ඒ බව වගඋත්තරකරුවන් විසින්ම කොමිෂන් සභාවට ඉදිරිපත් කොට ඇති ලේඛන පරීක්ෂා කිරීමේදී අනාවරණය වේ. දේශන සඳහා පැමිණීමේ ප්‍රතිශතය ශූන්‍ය වූ සිසුන් හටද පෙර අදියර 3 තුළදී විභාගයට පෙනී සිටීමට ඉඩ ලබාදී ඇති බව ඉදිරිපත්ව ඇති දිවුරුම් ප්‍රකාශ මගින් අනාවරණය වී ඇත.

කිසියම් නීතියක් ව්‍යවස්ථාපිතව පැවතුනද එකී පවතින නීතියට පිටස්තරව කිසියම් සුවිශේෂී කාරණයක් සාධාරණීය කළ හැකි අයුරින් නැවත නැවත භාවිතය තුළ ක්‍රියාත්මක වී ඇත්තේ නම් එකී නිෂ්ක්‍රියව පවතින නීතියකට වඩා එකී භාවිතය තුළ පවතින නව රීතිය මත ඉදිරියටද කටයුතු සිදු වේ යයි එකී නීතියට බැඳී ඇති පිරිසට නිත්‍යානුකූල අපේක්ෂාවක් නිර්මානය වන බවට අර්ථකතනය කළ හැකිය.

නමුත් පාඨමාලාවේ අවසාන අදියරයේ අවසාන ලිඛිත පරීක්ෂණය සඳහා එතෙක් පැවත ඇති භාවිතය අහෝසි කරමින් අත්‍යාවශය පැමිණීම යන කාරණය දැඩිව ක්‍රියාත්මක කිරීමට පරිපාලනය තීරණය කොට ඇති අතර එකී තීරණය එනම් පැමිණීම 50% පැවතිය යුතු බවද දැනුම්දී ඇත්තේ එකම ඊමේල් පණිවිඩයක් මගින් පමණක් ය.

<u>දේශන සඳහා පවතින කාල පරිච්ඡේද</u>

දේශන සඳහා වෙන් කොට ඇති කාල පරිච්ඡේද සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැඩිව කරුණු විමර්ශනය කොට බලන ලද අතර එහිදී අනාවරණය වී ඇති පරිදි දේශන පැවැත්වීම ඉතා තදබදකාරී ලෙස පවත්වා ඇති බව නිරීක්ෂණය වී ඇත. එනම් පශ්චාත් උපාධි පාඨමාලාවට සමගාමීව අවසාන අදියරට අදාළ විෂයන් වන ජාත්‍යන්තර වෙළඳ නීතිය හා ජාත්‍යන්තර බේරුම්කරණ නීතිය (Intimation Arbitration Law) විෂයන් සලකා බැලීමේදී ඒ ඒ විෂයන් සඳහා පවතින දේශන කාල පරිච්ඡේද පරීක්ෂා කිරීමේදී මෙම විෂයන් දෙකම පැය 40ක් තුළ පැවැත්විය යුතු දේශන 40කින් සමන්විත වන අතර එකී පැය 40ක දේශන කාලසීමාව ප්‍රායෝගිකව පවත්වා ඇත්තේ දින 6ක් තුල ය. එනම් ප්‍රශ්න ගත ජාත්‍යන්තර වෙළඳ නීතිය (International Trade Law) විෂය සඳහා දින 4ක් තුළ එක් දිනකදී පැය 8ක් ලෙස පැය 32 ක කාලයක්ද දින 2කදී එක් දිනකට පැය 4ක් ලෙස පැය 8ක් තුළ ද වශයෙන් මුළු පැය 40ක දේශන කාල සීමාව අවසන් කොට ඇත. අවසාන අදියරයේ විෂයන් 2 ක සම්බන්ධයෙන් මේ හා සමාන කාල පරිච්ඡේද ප්‍රමාණයක් දේශන පවත්වා ඇති අතර ඒ බව වගඋත්තරකරුවන් විසින් ලබාදී ඇති ලිඛිත ලේඛන මගින් තහවුරු වී ඇත. ඒ අනුව නියමිත දේශන පැය 40න් පැය 32ක්ම දින 4ක් වැනි කෙටි කාලපරාසයක් තුළ පවත්වා ඇති බව තහවුරු වී ඇත.

ඉහත තත්වය තුළ දේශන පවත්වා ඇති දින 6න් එක් දිනයක් කුමන හෝ සාධාරණීය කළ හැකි හේතුවක් මත සහභාගිවීමට හැකියවක් නොමැති වන සිසුවෙකු හට පැය 8ක් දේශන කාල සීමාවක් අහිමිවීමේ හැකියාව පවතී. සම්පූර්ණ පැය 40ක දේශන කාලපරිච්ඡේද ප්‍රමාණයෙන් පැය 20ක කාලයක් 50% ක් ලෙස දේශන කාල සීමාවක් සියලුම සිසුන් සහභාගිවිය යුතු වන අතර උපාධි පාඨමාලාව තුළ යම් හෙයකින් දින 3ක් සහභාගිවීමට අපහසුවන කිසියම් සිසුවෙකුට 50% ක ප්‍රතිශතය නිතැතින්ම අහිමිවනු ඇත. මෙවැනි ඉතා තදබදකාරී දේශන කාලපරිච්ඡේද වෙන් කිරීම තුළ ශිෂ්‍යයින්ට දැඩි මානසික ව්‍යාකූලතාවයක් මෙම පාඨමාලාව තුළ නිර්මාණය වී ඇත. ඒ අනුව දේශන කාලපරිච්ඡේද වෙන් කිරීම සම්බන්ධයෙන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය තුළ සාධාරණීය කළ හැකි නෛතික ක්‍රමවේදයක් නොපවතින බව කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වී ඇත.

තවදුරටත් කොමිෂන් සභාව හමුවේ අවධානයට ලක්වන ලද ප්‍රධාන කරුණක් වන්නේ නියමිත පැමිණීමේ ප්‍රතිශතය සාධාරණීකරණය කළ හැකි සුවිශේෂී කරුණක් සපුරා නොමැති යම්

ශිෂ්‍යයෙකුහට හිමිවන විකල්ප සහනයන් කුමක්ද යන්නයි. එහිදී එවැනි තත්වයකදී අදාළ කොට ගත හැකි කිසියම් අභියාචනා ක්‍රමවේදයක් විශ්වවිද්‍යාල පරිපාලනය විසින් හදුන්වාදී නොමැති බව අනාවරණය වී ඇත.

<u>පාඨමාලාවට අදාළ නීතින් නිසියාකාරව ක්‍රියාත්මක කොට නොමැති බව</u>

පාඨමාලාව තුළ පැවරුම් භාරදීමේදී නියමිත කාලයේදී භාරදීම කිසිසේත් අපේක්ෂා නොකළ අතර ප්‍රමාදවී භාරදෙන පැවරුම් පසුව භාර ගැනීම වැනි ලිහිල් නෛතික තත්වයන් ක්‍රියාත්මක කොට ඇත. මෙම අධියර 3 තුළදීම දෙපාර්ශවය විසින්ම ඉදිරිපත් කර ඇති කරුණු වලට අනුව අනිවාර්ය පැමිණීමේ ප්‍රතිශතයක් සලකා බලා නොමැති අතර දැඩි නම්‍යශීලී පිළිවෙතක් සිසුන් කෙරෙහි අනුගමනය කර ඇත. එනම් දේශන සඳහා සහභාගිවීමේ ප්‍රතිශතය ශුන්‍ය වන සිසුන්ට පවා පළවන හා දෙවන අදියරයන්හිදී ලිඛිත පරීක්ෂණය සඳහා මුහුණ දීමටත් ඒ ඒ විෂය පැවරුම් ලබාදීමට නියමිත කාලයන් අවසන් වීමෙන් පසුවද කිසිදු නෛතික බාධාවකින් තොරව තම පැවරුම් භාරදීමේ හැකියාවක් මූලික කොට අනාවරණය වේ.

අවසාන අදියරට පැමිණෙන තෙක් සිසුන්ට ශිෂ්‍ය හැදුනුම්පතක් ලබා දී නොමැති බව ශිෂ්‍ය මාර්ගෝපදේශ පොත නියමිත ලෙස සිසුනට ලබා නොදීම. විභාග සහ දේශන විටින් විට වෙනස් කිරීම ආදී වූ පැමිණිලි පාර්ශවය විසින් දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරමින් ඉදිරිපත් කොට ඇති කරුණු සඳහා වගඋත්තරකාර පාර්ශවය පිළිගත හැකි ප්‍රතිඋත්තර සපයා නොමැත.

<u>පාඨමාලාවට අදාළ තොරතුරු සන්නිවේදනය කිරීමේක්‍රම වේදය</u>

කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය විසින් ශිෂ්‍යයින් වෙත තොරතුරක් දැනුම්දීමේ ක්‍රමවේදය කොමිෂන් සභාව විසින් ගැඹුරින් අවධානයට යොමු කරන ලද අතර එහිදී අනාවාරණය වූ ආකාරයට පිළිගත් හා සාධාරණීය කළ හැකි ක්‍රමවේදයක් අනුගමනය කළ ඇති බවක් නිරීක්ෂණය වී නොමැත. එනම් ඇතැම් අවස්ථාවලදී විශ්ව විද්‍යාල පරිපාලනය විසින් පාඨමාලාවට අදාළ ඇතැම් තොරතුරු ශිෂ්‍යයින් වෙත ලිඛිත ලේඛන මගින් දැනුම් දී ඇති නමුත් ඇතැම් තොරතුරු සම්බන්ධයෙන් එවැනි ලිඛිත ලේඛන මගින් දැනුම්දීම් සිදුකොට නොමැත. ප්‍රශ්නගත තොරතුර එනම් අවසාන අධියරයෙහි පැමිණීමේ ප්‍රතිශතය 50% නිශ්චිතවම සලකා බලන බවට වන තොරතුර සන්නිවේදනය කර ඇත්තේ එකම ඊමේල් පණිවිඩයක් මගින් පමණි. එනම් 2015 ජූනි 30 වන දින පාඨමාලාවේ සියලූ සිසුන් වෙත පැමිණීම 50% අවශ්‍යතාවයක් පැවතිය යුතු බවට ඊමේල් පණිවිඩයක් යවා ඇත. එකී ඊමේල් පණිවිඩය පරීක්ෂා කිරීමේදී එකී ඊමේල් පණිවිඩය නියමිත ප්‍රමිතින්ගෙන් තොරව යොමු කොට ඇති අතර, එම ඊමේල් පණිවිඩය සියලූම අයදුම්කරුවන් වෙත යොමු කර ඇද්ද යන්න ද ප්‍රශ්න සහගත කරුණක් ලෙස තවදුරටත් අනාවරණය වී ඇත.

නමුත් උසස් අධ්‍යාපන ආයතනයක් තුල තොරතුරු සංනිවේදනය කිරීම ක්‍රමවත් හා සාර්ථක ක්‍රමවේදයක් යටතේ සිදු කළයුතු බවත් එසේ නොමැතිව කුමන හෝ පවතින සංනිවේදන ක්‍රමයක් ප්‍රමිතියකින් තොරව භාවිතා කල පමණින් නමත් අදාල තොරතුරු ශිෂ්‍යයින් වෙත දැනුම් දී ඇති බවට විශ්ව විද්‍යාල පරිපාලනය විසින් විත්තිවාචක සැපයීම යුක්තිසහගත ක්‍රියාවක් නොවනු ඇත.

ඒ අනුව කිසියම් දීර්ඝ කාලයක් තුල පැවත ඇති ක්‍රමවේදයෙහි යම්කිසි වෙනස්කිරීමක් සිදු කරන්නේ නම් එකී වෙනස්වීම් පිළිබඳ එයට අදාළ වන ඒ ඒ පුද්ගලයන් දැනුවත් කිරීම නියමිත සහ නිවැරදි ක්‍රමවේදයක් තුල සිදු කළ යුතු බවත් එවැනි ක්‍රම වේදයක් අනුගමනය නොකිරීම තුළ පුද්ගලයින් මත ඒ වන විට නිර්මාණය වී ඇති නිත්‍යානුකූල අපේක්ෂාවන් උල්ලංඝනය වීමට ඉඩ ප්‍රශ්නාවක් ඇති බවට තිරණය කිරීමේ හැකියාව පවතින බවත් නිරීක්ෂණය වී ඇත.

<u>දයාරත්න සහ තවත් අය එදි. සෞඛ්‍ය අමාත්‍යාංශය</u> නඩු තීන්දුවේදි ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු අමරසිංහ විනිසුරුතුමා ඉදිරිපත් කොට ඇත්තේ පවතින ප්‍රතිපත්තීන් වෙනස් කිරීම තුලින් පුද්ගලයින් කෙරෙහි එය අහිතකර ආකාරයෙන් බලනොපාන බව දැනුවත් වීමට ඔවුන්ට අවස්ථාවක් තිබිය යුතු බවයි. (when a change of policy is likely to frustrate the legitimate expectation of individuals, they must be given an opportunity of stating why the change of policy should not be affect them unfavorably)

ඒ අනුව කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ නිතිය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව තුල පවත්නා පරිපාලන ක්‍රමවේදයන් හා නෛතික අවශ්‍යතාවයන් දීර්ඝ කාලිනව අකර්මන්‍යව පවතින බවත් ඒ තුළ එයට හුරුව ක්‍රියා කිරීම වරදක් නොවන බවට ඒත්තු ගැන්වෙන ආකාරයෙන් විශ්ව විද්‍යාල පරිපාලනය විසින්ද දීර්ඝ කාලිනව ක්‍රියා කොට ඇති බවත් නමුත් ක්ෂණිකව එකී පැවති ක්‍රියාවලිය වෙනස් කිරීමට පරිපාලනය විසින් තිරණය කොට ඇති බවත් නමුත් එසේ ගෙන ඇති තිරණය පිළිබඳව ශිෂ්‍යයන් දැනුවත් කිරීමට නිත්‍යානුකූල ක්‍රමවේදයක් අනුගමනය කොට නැති බවත් අනාවරණය වී ඇත. පාඨමාලාවේ අවසාන අදියර ආරම්භ කිරීමට පෙර එනම් 2015 ජුනි 30 වන දින යවනු ලබන එකම ඊ-මේල් පණිවිඩයක් මගින් දේශන සඳහා 50% ක පැමිණීම අවශ්‍ය වන බවට වන තොරතුර සංනිවේදනය කිරීමට ක්‍රියාකර ඇති නමුත් එකී ඊ-මේල් පණිවිඩයද පිළිගත් ප්‍රමිතීන් යටතේ සිදු කොට නොමැති බවත් අදාල සියලු ශිෂ්‍යයින් වෙත එය ලබාදී ඇද්ද යන්න තහවුරු කොට නොමැති බවත් ඉදිරිපත් වී ඇති දිවුරුම් ප්‍රකාශ හා වෙනත් ලේඛන මගින් තහවුරු වී ඇත.

ඉහත ඉදිරිපත්ව ඇති සියලුම කරුණු පරීක්ෂා කොට බැලීමේදි කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය තුල නිතිය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව පැවැත්වීම සම්බන්ධයෙන් ප්‍රශ්න සහගත ව්‍යාකූල තත්වයක් පැනනැගී ඇති බව අනාවරණය වී ඇත.

එනම්, අවුරුදු 02ක පාඨමාලා කාලය තුළ නිවැරදිව පවතින නෛතික තත්වයන් ක්‍රියාත්මක කොට නොමැති බවත්, ශිෂ්‍යයින්ට සාධාරණය වන ආකාරයෙන් අත්‍යාවශ්‍ය නිති තත්වයන් හදුනාගෙන නොමැති බවත්, ආකර්යක්ෂම පරිපාලන කටයුතු මෙන්ම ආකාර්යක්ෂම සංනිවේදන කටයුතු හේතුවෙන් අදාල වසර 02ක කාලය තුළ ශිෂ්‍යන්ට දුෂ්කර අධ්‍යයන කාල සීමාවක් නිර්මාණය කොට දි ඇති බවත් යන කරුණු අනාවරණය වී ඇත. විශේෂයෙන්ම නිරික්ෂණය වන්නේ දේශන නියමිත ආකාරයට පවත්වා නොමැති බැවින් ශිෂ්‍යයන්ට බලවත් අසාධාරණයක් වී ඇති බවයි.

එසේම සමස්ථ පාඨමාලාව තුළ පවතින ඉහත පරිපාලන ආකර්යක්ෂමතා මේ දක්වා නිවැරදි කිරිමට පරිපාලකයින් විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවද වැඩි දුරටත් තහවුරු වී ඇත.

ඒ අනුව පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් මූලික කොට දක්වා ඇති ආකාරයට නීතිය පිළිබද පශ්චාත් උපාධි පාඨමාලවේ අවසාන අදියරේ අවසාන ලිඛිත පරිකෂණයට අදාල එක් විෂයකට පමණක් එනම් අන්තර්ජාතික වෙළද නීතිය විෂයට අදාල ලිඛිත පරිකෂණයට මුහුණදීමට 50% ක පැමිණිමේ ප්‍රතිශතයක් නොමැත යන කාරණය තුළ අවස්ථාව ලබා නොදීම මගින් කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාල පරිපාලනය විසින් පැමිණිලිකරුට අදාලව පරිපාලනමය අකාර්යක්‍ෂමතාවක් සිදු කොට ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබයි.

ඒ අනුව තම අයිතිවාසිකම් වෙනුවෙන් නිතිය ඉදිරියේ අවදියෙන් සිටිමින් නීතියේ පිහිට පැතිමට ඉදිරිපත් වී ඇති පැමිණිලිකරු සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ජේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් ආරක්‍ෂා කොට දි ඇති මූලික අයිතවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් ක්‍රියා කොට ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිගමනය වේ.

**නිර්දේශය :-**

ඒ අනුව පැමිණිලිකරුට ප්‍රශ්නගත අන්තර්ජාතික වෙළද නීතිය විෂයට අදාල ලිඛිත පරිකෂණයට මුහුණ දීමට මානව හිමිකම් කොමිෂන් සභාවේ අතුරු නිර්දේශයට අනුකූලව ලබා දි ඇති අවස්ථාවට අනුව පැමිණිලිකරුගේ එකී ලිඛිත පරිකෂණයේ ප්‍රතිඵල නිකුත් කළයුතු බවට වගඋත්තරකාර පාර්ශවය වෙත මෙයින් නිර්දේශය කරනු ලැබේ.

2016.08.20 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
**Chairperson**
**Human Rights Commission of Sri Lanka**

B/RJ & My Com